# පිළිසඳර
# PILISANDARA

2019
ඔක්තෝම්බර්/ දෙසැම්බර්
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Society of Sri Lanka


## 2020
## සුබ නව වසරක් වේවා ආසිරි

උදාවූ 2020 නව වසර
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ
සියලු සාමාජික භවතුන්ගේ බලාපොරොත්තු
ඉටුවන වාසනාවන්ත සුබ නව වසරක් වේවා!!

## ඡායාරූප පන්ති
ජනවාරි මස 26 සිට

## ලාංකේය ඡායාරූප කලා මහා වෘක්ෂයට 70 වසරයි



## විල්සන් හැගොඩ 35 වන ගුණානුස්මරණය

ඡායාරූප කලා මහගෙදර මහඇදුරු විල්සන් හැගොඩ සූරීන්ගේ 35 වන ගුණානුස්මරණය වෙනුවෙන් පවත්වනට යෙදුණු ගුණානුස්මරණ දෙසුම මෙවර තිලක ආර්. වෙරළුපිටිය මහතා විසින් සැප්තැම්බර් මස 15 වන ඉරුදින කොළඹ මහාබෝධි විද්‍යාල පරිශ්‍රයේ දී පවත්වන ලදී. මේ සදහා ගරු විල්සන් හැගොඩ මහතාගේ පුතුන් වන අනුර හැගොඩ මහතා ඇතුළුව එම මැතිණිය මෙන්ම පාලිත හැගොඩ මහතා ද සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය මෙන්ම ඡායාරූප පාඨමාලාවේ විද්‍යාර්ථීන් ද එක්ව සිටියහ. එම දේශනයේ දී වෙරළුපිටිය මහතා විසින් ශ්‍රී ලාංකේය ඡායාරූප කලාවේ හැගොඩ නාමය හෙට දවසට පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳ පෙර සංසිද්ධි ආශ්‍රයෙන් කරුණු රැසක් ගෙන හැර පාන ලදී.



## නව වසරේ ඡායාරූප කලා මහගෙදර වගකීම නව අධ්‍යක්ෂ මඬුල්ලකට

I03 පිටුවට

## 57 වන වරටත් ඡායාරූප ශිල්ප පරීක්ෂණය පැවැත්වේ

I04 පිටුවට

## ඡායාරූප ශිල්පයට ලැදි පාසල් සිසුන්ට මෙවරත් සංගමයේ දොර විවර වේ

I04 පිටුවට

## වාර්ෂික සුහද හමුව එළඹෙන මාර්තු 14
දැන්ම දිනය වෙන්කර ගන්න

## අපි හමුවන දවස පෙබරවාරි 16

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අර්ධ වාර්ෂික සභා රැස්වීම පෙබ. 16 වන ඉරුදින පෙ.ව. 09 ට, කිරුල පාරේ පිහිටි පුවත්පත් ආයතනයේ දී පැවැත්වීමට සැලසුම් කොට ඇත. එදිනට ඔබගේ පැමිණීම ගෞරවයෙන් යුතුව අපේක්ෂා කරමු. නිල දැන්වීම හා ආරාධනය සඳහා පිළිසඳර ඇතුළු පිටු බලන්න.

## ප්‍රායෝගික පරීක්ෂණවලට දින නියම වේ

තෙවන වසර - පෙබරවාරි 09
දෙවන වසර - පෙබරවාරි 23
පළමු වසර, බාහිර හා පාසල් - මාර්තු 01

## ප්‍රමුඛ පුවත්

# නිල ආරාධනා පත්‍රය

## අර්ධ වාර්ෂික සභා රැස්වීම - 2019/2020

හිතවත් සාමාජික / සාමාජිකාවන් වෙත,

අප සංගමයේ 2019/2020 වර්ෂයේ අර්ධ වාර්ෂික සභා රැස්වීම පහත සඳහන් දින පැවැත්වීමට තීරණය කර ඇත.

| | | |
|---|---|---|
| දිනය | : | 2020 පෙබරවාරි මස 16 වැනි ඉරු දින |
| වේලාව | : | පෙරවරු 09.00 ට |
| ස්ථානය | : | කොළඹ 05, ශ්‍රී ලංකා පුවත්පත් ආයතන ශ්‍රවණාගාරයේ දී |

මෙදින රැස්වීමට ඔබගේ පැමිණීම අප ගෞරවයෙන් යුතුව අපේක්ෂා කරමු.

*ගරු අධ්‍යක්ෂ මණ්ඩලය*

## අර්ධ වාර්ෂික සභා රැස්වීම - 2019/20
## න්‍යාය පත්‍රය

- චිරාගත චාරිත්‍රානුකූලව පොල් තෙල් පහන දැල්වීම
- ජාතික ගීය වාදනය කිරීම
- සභාව පිළිගැනීම - සභාපති, කංචන මාරසිංහ මහතා
- අප අතරින් වියෝවී ඇති සාමාජික/ සාමාජිකාවන් සිහිකිරීම
- ලිපි කියවීම
- ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීම - විධායක අධ්‍යක්ෂ, සමන් කුලසූරිය මහතා
- අයවැය සමාලෝචනය ඉදිරිපත් කිරීම - මුදල් අධ්‍යක්ෂ, කීර්ති නිශ්ශංක මහතා
- අදහස් හා යෝජනා
- ස්තුතියි කතාව - විධායක අධ්‍යක්ෂ, සමන් කුලසූරිය මහතා

**මතකනේ.. පෙබරවාරි 16 ඉරිදාවේ.. උදේ 09 ට.. කිරුළ පාරේ පුවත්පත් ආයතනයට..**

අර්ධ වාර්ෂික සභාවේ දී ඉදිරිපත් කළයුතු ඔබගේ අදහස් යෝජනා වෙතොත් පෙබරවාරි මස 02 වන දිනට ප්‍රථම, ලිඛිතව ඉදිරිපත් කිරීමට කාරුණික වන්න, නොඑසේනම් ගරු විධායක අධ්‍යක්ෂ, නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ යන ලිපිනයට ඉහත දිනට පෙර ලැබීමට සලස්වන්න.

**අධ්‍යක්ෂ මණ්ඩලය 2019/20**



# නව වසරේ ඡායාරූප කලා මහගෙදර වගකීම නව අධ්‍යක්ෂ මඬුල්ලකට

- **ගරු සභාපති**

  කංචන මාරසිංහ මහතා
- **ගරු විධායක අධ්‍යක්ෂ**

  සමන් කුලසූරිය මහතා
- **ගරු මුදල් අධ්‍යක්ෂ**

  කීර්ති නිශ්ශංක මහතා
- **ගරු ලේඛකාධිකාරී අධ්‍යක්ෂ**

  සාලිය ලියනගේ මහතා
- **ගරු අධ්‍යාපන අධ්‍යක්ෂ**

  රෝහිත ගුණවර්ධන මහතා
- **ගරු ප්‍රකාශන අධ්‍යක්ෂ**

  මනුජිත් කටුගම්පොළ මහතා
- **ගරු ප්‍රදර්ශන අධ්‍යක්ෂ**

  සංඛ සම්මාන පෙරේරා මහතා
- **ගරු සංවර්ධන අධ්‍යක්ෂ**

  තුෂාර සමරකෝන් මහතා
- **ගරු සමාජසේවා හා සුබසාධන අධ්‍යක්ෂ**

  නෙරන්ජන් වික්‍රමාරච්චි මහතා

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 66 වන වාර්ෂික මහා සභාව සැප්තැම්බර් මස 01 වැනි දින පෙරවරුවේ කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. ඉදිරි වසර තීරණාත්මක වර්ෂයක් බැවින් සභාවේ ඒකමතික යෝජනාව මත 2019/20 නිල වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කෙරිණි. එසේ ම සංගමයේ සියලු දෙනාගේ ශක්තිය, ධෛර්යය සහ ආශිර්වාදය එක් කරමින් 70 වන සංවත්සරය ඇතුළුව අනිකුත් කටයුතු වඩා විධිමත් ව දියත් කිරීමට නව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දීමට එකඟතාව පලකෙරිණ. විශේෂ අධ්‍යාපනික කාරණා කිහිපයක් පුළුල්ව සාකච්ඡාවට ගැනීම පිණිස ඉදිරියේ දී විශේෂ මහා සභාවක් පැවැත්වීමට තීරණය කෙරිණි.

66 වන මහසභාවේ දී අධ්‍යක්ෂ ප්‍රකාශන ධූරයට තේරීපත් වූ ප්‍රදීප් වේදමේස්ත්‍රිගේ මහතා පුද්ගලික කාරණයක් මත එම තනතුරෙන් ඉල්ලා අස්වීමෙන්, පුරප්පාඩු වූ අධ්‍යක්ෂධූරයට හිටපු ප්‍රකාශන අධ්‍යක්ෂවරයෙකු වන මනුජිත් කටුගම්පොළ මහතා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලදී.













## විශේෂ මහා සභා රැස්වීම

**පසුගිය 66 වන මහා සභාවේ දී ගත් තීරණයක් මත කරුණු කිහිපයක් අරභයා පැවැත් වූ විශේෂ මහා සභා රැස්වීමක් 2019 සැප්. 29 වන දින පෙරවරුවේ කොළඹ මහාබෝධි විද්‍යාලයේ දී ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලිකත්වයෙන් පැවැත්වීමට යෙදුණි. මෙහිදී පසුගිය වසරේ ඡායාරූප ශිල්ප පරීක්ෂණය හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමක් සභාපතිවරයාගේ මූලිකත්වයෙන් සිදුවිය.**





## 70 වන සංවත්සරය වෙනුවෙන්

ජායාරූප කලා මහ ඇදුරු
විල්සන් හෑගොඩ ශ්‍රීමතාණන් විසින්
1950 වසරේ දී ලාංකේය පොදු ජනයා අතරටත්
ජායාරූප ශිල්පය ලබාදීමේ අරමුණින්
ආරම්භ කරන්නට යෙදුණු
ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමය
2020 වසර වන විට 70 වන වියට පා තබයි.
70 වන සංවත්සරය නිමිත්තෙන් 2020 වර්ෂය පුරා
වැඩසටහන් රාශියක් අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම මත
පැවැත්වීමට කටයුතු සිදුකරමින් තිබේ.
එම කටයුතු ඉදිරි පිළිසඳර තුළින් දැනුම්දෙනු ලැබේ.

## LNPAS, ANPAS, FNPAS අයදුම් කිරීම

ඡායාරූපශිල්පීන්ගේ නිර්මාණ කුසලතා සහ ශාස්ත්‍රීය දක්ෂතා අගයමින් සංගමය මඟින් පිරිනමන සම්මාන වෙනුවෙන් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවයි. අවසන් දිනය මාර්තු මස 08 වේ. පරි/ 007/ 004 අංක දරණ චක්‍රලේඛනයේ ප්‍රතිපාදන පරිදි මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය. අවශ්‍ය විමසීම්, ගරු ලේඛකාධිකාරී අධ්‍යක්ෂ සාලිය ලියනගේ මහතා (0713 963030) අමතන්න.



# 57 වන ඡායාරූප ශිල්ප පරීක්ෂණය

වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය 57 වන වරටත් පසුගිය දෙසැම්බර් 22 වන ඉරුදින කොළඹ මහාබෝධි විද්‍යාලයේ දී පැවැත්වුණි. 2019 වර්ෂය සඳහා පළමු වසරින් විද්‍යාර්ථීන් 100ක් ද, දෙවන වසරින් විද්‍යාර්ථීන් 50ක් හා ඩිප්ලෝමා වසරින් විද්‍යාර්ථීන් 30 දෙනෙකු ඡායාරූප පරීක්ෂණය සඳහා පෙනී සිටියහ. ඔවුන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය එළඹෙන පෙබරවාරි මස දෙවන සතියේ පැවැත්වේ. ගරු ලේඛකාධිකාරී අධ්‍යක්ෂ සාලිය ලියනගේ මහතා සහ ගරු අධ්‍යක්ෂ අධ්‍යාපන රෝහිත ගුණවර්ධන මහතා ඡායාරූප ශිල්ප පරීක්ෂණය මෙහෙයවීම සිදුකරයි.







# පාසැල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය 2019







ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් පාසල් දරුවන් වෙනුවෙන් පවත්වන ඡායාරූප ශිල්ප පරීක්ෂණය පසුගිය දෙසැම්බර් 21 වන ඉරු දින කොළඹ මහාබෝධි විද්‍යාලයේ දී පැවැත්විණි. ඒ සඳහා 50 කට ආසන්න අපේක්ෂකයින් ප්‍රමාණයක් සහභාගී විය. මෙවර පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය සංගමයේ ඩිප්ලෝමා පරීක්ෂණයේ පළමු වසර ප්‍රශ්න පත්‍රයට සමගාමීව ලබාදුන් අතර එම පරීක්ෂණයෙන් සමත් වීමෙන් අනතුරුව ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන වසර සඳහා ඇතුළත් වීමට අවස්ථාව උදා වේ.

# ගුරු හමුවක්..

ඡායාරූප පාඨමාලාවේ තෙවසරටම අදාල දේශකවරුන්ගේ හමුවක් පසුගිය දෙසැම්බර් 11 වන දින නාරාහේන්පිට පුවත්පත් ආයතන ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. එහිදී ඉදිරි වසරට අදාලව ඡායාරූප පාඨමාලාවේ ඇතිවිය යුතු සංශෝධන පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරන ලදී.





# නව වසරත් සමඟ අලුත්වන ඡායාරූප ශිල්ප පාඨමාලා විෂය නිර්දේශය

දෙසැම්බර් 25 වන දින පුවත්පත් ආයතනයේ පැවැති විෂය නිර්දේශ සංශෝධන සාකච්ඡාවේ දී තීරණය වූ පරිදි මෙම වසරේ සිට ඡායාරූප පාඨමාලාවේ අදාළ නව විෂය සංශෝධන සිදු කිරීමට පියවර ගනු ලැබේ. මේ පිළිබදව සම්බන්ධීකරණ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල පූර්ණ අධීක්ෂණය යටතේ ලේඛකාධිකාරී අධ්‍යක්ෂ සාලිය ලියනගේ මහතා සහ අධ්‍යාපන අධ්‍යක්ෂ රෝහිත ගුණවර්ධන මහතා විසින් සිදුකරනු ඇත.

# 2018 පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණ සහතිකපත් ප්‍රදානය

පසුගිය 2019 සැප්තැම්බර් මස 01 වන ඉරුදින, මහවැලි කේන්ද්‍රයේ දී 66 වන මහා සභා රැස්වීමට සමගාමීව, 2018 වසරේ පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණයෙන් සමත් වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සහතිකපත් ප්‍රදානය ගරු සභාපති කංචන මාරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ. එම සහතිකලාභීන් වෙනුවෙන් ප්‍රවීණ ඡායාරූපකලාවේ දී බන්දු ගුණරත්නයන් විසින් සුවිශේෂී ඉදිරිපත් කිරීමක් ඇතුළත් දේශනයක් සිදුකරණ ලදී.



# තෙවන වසරින් රිවස්ටන් සහ මන්දාරම් නුවරට



2019 තෙවන වසර විද්‍යාර්ථීන් එක්ව පසුගිය ඔක්තෝබරයේ මන්දාරම් නුවර සහ රිවස්ටන් චාරිකාවන් පැවැත්විය. රිවස්ටන් ගමන සඳහා ප්‍රියන්ත බණ්ඩාර මහතාගේ සම්පත් දායකත්වයෙන් භූමි දර්ශන ඡායාරූප සැසියක් මෙන්ම මන්දාරම් නුවර ගමනේ දී ප්‍රියන්ත අබේසුන්දර මහතාගේ උපදේශකත්වය එක්ව තිබුණි. මෙහි අධීක්ෂණ කටයුතු තෙවන වසර පන්ති සම්බන්ධිකාරක ගාමිණී ආර්. ෆොන්සේකා මහතා සිදු කර ඇත.








# ප්‍රායෝගික සැසි පිරි දෙවන වසර

ඡායාරූප ශිල්ප පාඨමාලාවේ දෙවන වසර විද්‍යාර්ථීන් වෙනුවෙන් පවත්වන ප්‍රායෝගික සැසි මාලාවේ වසරේ තවත් අදියරක් පැවැත්විය. ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ දෙවන වසර පන්ති සම්බන්ධිකාරක ප්‍රේමසිරි හිදෙල්ලආරච්චි මහතා විසින් සුපුරුදු පරිදි වැඩසටහන් සංවිධානය කෙරිණ. මෙම සැසි යටතේ,

සැප්තැම්බර් - බත්තරමුල්ල දියසරු උයනේ දී:
» ඡායාරූපකරණයේ දී ආලෝකයේ භාවිතාව පිළිබඳව, නාරද අමරතුංග මහතාගේ මූලිකත්වයෙන් බන්දු ගුණරත්න, උදේනි අල්විස් යන ප්‍රවීණ ඡායාරූපවේදීන්ගේ සම්පත්දායකත්වයෙන් සැසියක් පැවැත්වීය.

ඔක්තෝම්බර් - මහාබෝධි විද්‍යාලයේ දී :
» Portrait & Fashion Photography, මීශා ගුණවර්ධන
» Product Photography, රසික සූරසේන
ප්‍රායෝගික සැසි පැවැත්වීය.

## සංවර්ධන හා ප්‍රවර්ධන පුවත්

SLECC පරිශ්‍රයේ දී පසුගිය ඔක්තෝම්බර් මස 4, 5 සහ 6 යන තෙදින පුරා Future Image 2019 ප්‍රදර්ශනයට සමගාමීව අප සංගමයේ ජයග්‍රාහී ඡායාරූප නිර්මාණ ඇතුළත් ප්‍රදර්ශන කුටියක් පැවැත්වීය. මේ කටයුත්ත මෙහෙයවීම වත්මන් සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ තුෂාර සමරකෝන් මහතා අතින් සිදු කෙරුනු අතර සංගමයේ විද්‍යාර්ථීන්ගේ නොමසුරු සහයෝගය ද ලැබුණි.




**Future Image අපේ කුටිය..**

## සමාජ සේවා පුවත්





වාර්ෂිකව සංවිධානය වන දෙදින චාරිකාව මෙවර යෙදුනේ සුන්දර මීමුරේ ප්‍රදේශයටය. සමාජ සේවා අධ්‍යක්ෂ නෙරංජන් වික්‍රමආරච්චි මහතාගේ සංවිධාන ශක්තිය මත අප සාමාජික භවතුන් සියයකට ආසන්න පිරිසකගේ ගේ සහභාගීත්වයෙන් පසුගිය නොවැම්බරයේ 23 සහ 24 දෙදිනක් මීමුරේ තුරුලිය සමග ගත කළහ.
මීමුරේ ගමන සඳහා කළුබෝවිල සේයා කලර් ආයතනයේ අධ්‍යක්ෂ අතුල ඩයස් මහතාගේ අනුග්‍රාහකත්වය යටතේ චාරිකාවේ දී ලබාගත් සේයාරූ තුළින් තෝරා ගත් ජයග්‍රාහකයන් සඳහා තිලිණ ලබා දීම සිදු කෙරිණ.





## ප්‍රදර්ශන පුවත්



### 43 වන ඡායාරූප දැක්මේ.. ත්‍රිකුණාමලය දිගහැරුම..

43 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ තෙවන අදියර පසුගිය සැප්තැම්බරයේ Trincographers ඡායාරූප සංගමයේ Mesmerizing Trincomalee ඡායාරූප දැක්මට සමගාමීව ත්‍රිකුණාමලය නගර සභා ශාලාවේ දී ප්‍රදර්ශනය කෙරිණ.




## අපගේ ශෝකය

- අප ගෞරව සාමාජික මෙන්ම ප්‍රභාලේඛිකා සංසදයේ ආරම්භක සභාපතිනිය වන රාණි වීරවර්ධන මහත්මියගේ අභාවය පිළිබඳව පවුලේ ඥාතීන් වෙත සංගමයේ බලවත් සංවේගය ප්‍රකාශ කරමු.
- අප සාමාජික කුමාර සේනානායක මහතාගේ දයාබර පියාණන්ගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.

අපේ අයෙක්

# කාච ශිල්පයට පෙම්බැඳි සොඳුරු මුල් ගුරුතුමා



වසර 70 වක සාඩම්බරණීය ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමයේ සාමාජිකත්වය ලැබ එහි සෙවණෙහි හැදී වැඩුණු බොහෝ දෙනා අතරින් සංගමයේ ඉදිරි පැවැත්ම සඳහා සිය ශක්ති ප්‍රමාණයෙන් අත්වැල් සපයන, එහි උන්නතිය වෙනුවෙන් ඇප කැප වෙන සාමාජිකයෝ ප්‍රමාණය ස්වල්පයකි. එම සාමාජිකයෝ සංගමය වෙනුවෙන් සිය යුතුකම් ඉටු කරනුයේ ඉන් ලැබූ ශිල්ප ඥානය නිසා පමණක් නොව ඉන් ජනිත වූ සහෝදරත්වයේ බැඳීම නිසාවෙනි. මෙකී සාමාජිකයෝ අතරින් අප හඳුනාගත යුතු චරිතයකි ඇස්. ඩී. පියදාස.

සහෝදර සහෝදරියන් සිව්දෙනෙකුගෙන් යුත් පවුලක තෙවැන්නා ලෙස උපත ලැබූ ඇස්. ඩී පියදාස මහතා කුඩා කළ සිටම අභියෝග හමුවේ නොසැලෙන මනා ආත්මශක්තියකින් හෙබි චරිතයක් විය. අම්මාගේත් තාත්තාගේත් ආදරය මැද, වැඩිමහල් අක්කාගේ හා අයියාගේ ගුරුහරුකම් මැද හැදී වැඩුණු මොහුට බාල සහෝදරයෙක් ද විය. ඇහැළියගොඩ නැන්දණියගේ නිවසේ වාසය කරන කළ සිය ප්‍රාථමික අධ්‍යාපනය ආරම්භ කරන මොහු බණ්ඩාරවත්ත පරාක්‍රම ප්‍රාථමික විද්‍යාලට ඇතුළත් වී සිය ද්විත්වීය අධ්‍යාපනය අවසන් කළේය. පාසල් අධ්‍යාපනයෙන් පසුව ගුරු විභාගයට පෙනී සිටී මොහු සියනෑ ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් වසර දෙකක පුහුණුවක් ලැබ 1963 දී ගුරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. අංක ගණිතය, ශුද්ධ ගණිතය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව හා භූ ගෝල විද්‍යාව ඉගැන්වීමේ සමතෙකු වූ මොහු ගණිත ගුරුවරයෙකු ලෙස කෑගල්ල දිගල විද්‍යාලයෙන් සිය ප්‍රථම වෘත්තීය ගමන්මඟ ඇරඹීය. අනතුරුව බප/ගම් තෙලඟපාත විද්‍යාලය, බප/ගම් දුටුගැමුණු විද්‍යාලය, නායකන්ද පිරිමි මහා විද්‍යාලය යන පාසල්වලද සිය රාජකාරි ඉටු කළ පියදාස මහතාගේ වෘත්තීය ජීවිතයේ ජයග්‍රාහී කඩඉම උදාවූයේ 1989 වර්ෂයේදීය. ඒ එඬේරමුල්ල ගොංගිතොට විද්‍යාසාධක විද්‍යාලයට පළමුවන ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු ලෙස උසස්වීම් ලැබීමයි. මෙය එක් අතකට ඔහු ලැබූ අභියෝගාත්මක ජයග්‍රහණයක් ද විය.



"..මට මතකයි කොටි බෝම්බ ගහන කාලෙත්... අපි සංගමයේ රාජකාරි වෙනුවෙන් මහබෝධියට ආවා.."

"ඒ 1989 අවුරුද්ද. මට මතකයි පළමුවෙනි ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු ලෙස පත්වීම් ලිපිය ගෙදරට ලැබුණා. ලිපිය කියවූ වහාම තාත්තා කිව්වේ; "උඹ ඕකට යන්න එපා, ගෙදර ඉඳහන්; මට පුළුවන් උඹට කන්න දෙන්න කියල". ඒ පාර මම කිව්වා, "එහෙම හරියන්නෙ නෑනේ තාත්තේ. මම ගිහිං බලන්නම් කියලා." ඒ පාසල පිහිටල තිබුණේ ජනපදයක. බහුවාර්ගික, බහුආගමික උදවිය එහි වාසය කළා. ඒක දුෂ්කරතා බොහෝමයක් තිබුණු ප්‍රදේශයක්. පාසලේ වැඩ කරපු ගුරුවරු උදේට එනව හවසට වැඩක් නොකර ඔහේ යනවා. වරක් එවක නගරාධිපති මට කිව්වා මේ පාසල ගුරුවරුන්ට දඬුවම් මාරු ලබා දෙන පාසලක් කියලා. කවුරු කොහොම කිව්වත් මම වැඩ කරන්න පටන් ගත්තා. පාසලට උදේම යනවා. හවස් වෙලා තමා ගෙදර එන්නේ. මම වැඩ කරන කොට ඉබේම ළමයි, ගුරුවරු, දෙමව්පියෝ මගේ පිටිපස පෙළ ගැහුණා. මම උදේ 6.30 වෙද්දි පාසලට යනවා. 7.30 වෙනකම් ළමයින්ට ගණිතය කියල දෙනවා. 7.30ට සුපුරුදු ලෙස පාසලේ වැඩ පටන් ගන්නවා. මම යද්දි පාසලේ ළමුන් 476 හිටියේ. මම විශ්‍රාම ගනිද්දි ළමුන් දහසත් ඉක්මවලා. මම වැඩ බාරගන්නකොට පාසලට එක ගොඩනැගිල්ලයි තිබුණේ. මම තව තෙමහල් ගොඩනැගිල්ලක් හදලා එය ජන අයිතියට පැවරුවා. බුදු මැදුරක් හැදුවා. සාමාන්‍ය පෙළ සමත් වන ප්‍රමාණය වැඩි කරලා උසස් පෙළ පන්ති ආරම්භ කළා. ළමුන් විශ්ව විද්‍යාලය දක්වා රැගෙන ගියා. පාසලේ වතුර, විදුලිය පවා තිබුණේ නෑ. ඒ සියල්ල පාසලට ලබාගත්තා. මුරකරුවෙකුගේ අවශ්‍යතාවය පවා ලබා ගත්තා. සෑම වර්ෂයකම නිවාසාන්තර ක්‍රීඩා උලෙළ උත්කර්ෂවත් ලෙස පැවැත්වුවා. සෑම ආගමික උත්සවයකටම මුල් තැන දුන්නා. ළමයින් වෙනුවෙන් දිවා රෑ වෙහෙස නොබලා අංගසම්පූර්ණ පාසලක් නිර්මාණය කරන්න වැඩ කළා. පාසලට කිට්ටුව තවත් කණිෂ්ඨ පසලක් තිබුණා. ඒ පාසලත් මේ විද්‍යාලයට පවරගෙන ඒකාබද්ධ පාසලක් කළා. අවසානයේ මගේ සේවා වෘත්තීය ජීවිතයේ වැඩිම කාලයක් විදුහල්පතිවරයෙක් ලෙස සේවය කර එම පාසලින්ම විශ්‍රාම ගැනීමට මට හැකි වුණා. මා සේවය කළ කාලය පාසලේ ස්වර්ණමය අවධිය ලෙස සටහන් කරමින් සම්මානයක් පවා ළමුන් ඇතුළු ගුරුවරු හා දෙමව්පියෝ එකතුවෙල මට තිළිණ කළා."

එඬේරමුල්ල ගොංගිතොට විද්‍යාසාධක මහා විද්‍යාලයේ ස්වර්ණමය යුගය බිහි කරමින් දැයේ දරුවන්ගේ නැණ පහණ දැල්වීමට අපමණ සේවයක් කළ ඇස්. ඩී පියදාස මහතා 1996 දී විශ්‍රාම දිවියට පැමිණියේ ය. විශ්‍රාම සුව විඳින අතරතුර එවක කැමරා සඟරාවක පළ වූ නිවේදනයක් දැක 2003 වසරේ දී ශ්‍රී ලංකා ජාතික කලා සංගමයට බැඳුණු මොහු 2005 වර්ෂයේ දී ජායාරූපකරණය ඩිප්ලෝමාව ලබා ගත්තේය. ජයාරූපකරණයෙන් දෙස් විදෙස් සම්මාන ලබා ගැනීමට සමත් වූ මොහු 2005 වසරේ දී විහාරමහාදේවි ශූරතා පළිහ ද ලබා ගත්තේය. එමෙන්ම මොහුගේ ජායාරූප බොහෝ සංඛ්‍යාවක් ප්‍රදර්ශන සඳහා තේරී ඇත.

"මම කැමරා සංගමයට සම්බන්ධ වීම ජීවිතයේ ගත් වටිනා තීරණයක්. ඩිප්ලෝමව ලබා ගත්තාට පස්සේ එවක සංගමයේ හිටපු සභාපතිතුමන් වන උදිත ගුණසේකර මහත්මයා කිව්ව මට ඩිප්ලෝමා පන්තිය භාර ගන්න කියලා. ඒ අනුව 2019 වසරේ මැදක් වනතුරුම එම පන්තිය භාරව කටයුතු කළා. ඒ කාල සීමාව තුළ සංගමය විසින් සිදුකළ හැම වැඩ කටයුත්තකටම සහයෝගය දුන්නා. වාර්ෂික චාරිකාවලට සහභාගී වීම, කාලසටහන් සකස් කිරීම, විභාග පරීක්ෂක කටයුතු සිදු කිරීම, උත්තර පත්‍ර බැලීමට සහභාගී වීම, ආධුනික ළමුන්ගේ සම්මුඛ පරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීම, සංගමයේ විවිධ කටයුතු සඳහා අවසර ලබා ගැනීමේ කටයුතු ඇතුළු වැඩ රාජකාරි බොහෝමයක් මගේ අතිශය පෞද්ගලික කාරණාවක් හැරුණු කොට අනෙක් සෑම දවසකම පැමිණ හැකි උපරිමයෙන් ඉටු කළා. සංගමයේ සෑම සමාජිකයේකුගේම අවමංගල්‍ය කටයුතු සඳහා නොවරදවාම සහභාගි වෙනවා. මට මතකයි කොටි බෝම්බ ගහන කාලේත් අපි සංගමයේ රාජකාරි වෙනුවෙන් මහබෝධියට ආවා."






ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමයේ 2007 වසරේ දී ANPAS, 2016 වසරේ දී FNPAS (Hons) හා 2017 වසරේ දී FNPAS යන ඇගයීම් සම්මාන ලබා ගත් ඇස්. ඩී. පියදාස මහත්මා මේ වන විට විශ්‍රාමික උපගුරු, සිය ආදරණීය බිරිඳ සමඟත් එකම දියණිය හා දරු මුණුපුරන්ගේ ආදරය මැද, ප්‍රදේශයේ විවිධ සමිති සමාගම්වල නායකත්වය දරමින්, ආගමික කටයුතුවල නියැලෙමින් ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමයේ නොයෙකුත් කටයුතු සඳහා ද සිය නොමසුරු දායකත්වය ලබා දෙමින් විවේකීයව කටයුතු කරයි. ඔහුගේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි සංගමයේ අපි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

අමානි ඉරේෂිකා රූපසිංහ

# අපේ විත්ති










## කලාභූෂණ රාජ්‍ය සම්මාන අපේම ප්‍රවීණයින් හට

35 වන කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙලේ දී ලාංකේය ඡායාරූප කලාවට කරන ලද අති මහත් සේවය අගයමින් ජීවිතයට එක්වරක් පිරිනමන කලාභූෂණ රාජ්‍ය සම්මානයන් අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් වන චන්ද්‍රසේන පෙරේරා, සිරිල් බස්නායක සහ සරත් පෙරේරා යන ප්‍රවීණ ඡායාරූප කලාවේදීන් හට පිරිනැමිණි. පසුගිය දෙසැම්බර් 15 වනදා ගරු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන් නෙලුම් පොකුණ රඟහලේ දී රාජ්‍ය කලාභූෂණ සම්මාන උලෙළ පැවැත්වුණි.

මෙහිදී සිරිල් බස්නායක මහතා වෙනුවෙන් එම සම්මානය ඔහුගේ පුත් ඡායාරූපශිල්පී තාරක බස්නායක විසින් ලබා ගත්තේය.


## ශාන්ත ගුණරත්නයන්ගේ කලු සුදු ඡායාරූපකරණය








ප්‍රවීණ ඡායාරූප කලාවේදී, ඡායාරූප ශිල්ප උපදේශක ශාන්ත ගුණරත්න මහතා විසින් රචිත කලු සුදු ඡායාරූප ශිල්පය ග්‍රන්ථය එළිදැක්වීම දෙසැම්බර් මස 14 වනදා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී සිදු කෙරිණි. මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතාහට පළමු ග්‍රන්ථය පිරිනැමුණු අතර ග්‍රන්ථය සඳහා පෙරවදන, අප සංගමයේ හිටපු සභාපතිවරයෙකු වන කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා විසින් සපයන ලද අතර ග්‍රන්ථය එළිදැක්වීමේ සංවිධාන කටයුතු ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ජාතික ඩිජිටල් ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාව මගින් සංවිධානය කෙරිණි.





## කැමරා කාචයෙන් සිතුවම් මවන මාස්ටර් රාජකරුණා


ලාංකේය ඡායාරූපකරණයේ විශ්වීය සලකුණක් වන හෙන්රි රාජකරුණා සූරීන්ගේ අටවන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය පසුගිය සැප්තැම්බරයේ කොළඹ ජේ. ඩී. ඒ. පෙරේරා කලාගාරයේ දී පවත්වන්නට යෙදුණි. 'Another World Unveiled' නම් වූ ප්‍රදර්ශනයෙහි සුවිශේෂීත්වය වනුයේ එය ප්‍රථම වතාවට එක් ප්‍රදර්ශන භූමියක, The Portrait of Humanity, Art of Blur සහ Photo Essay නමින් ඡායාරූප ප්‍රදර්ශන ත්‍රිත්වයක් ඉදිරිපත් කර තිබීමයි.




## මංගලනාත් උඩුකලගෙන් 'නිමේෂ' ඡායාරූප ප්‍රදර්ශනය

අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු මෙන්ම වර්තමානයේ එංගලන්තයේ පදිංචිව සිටින වෛද්‍ය මංගලනාත් උඩුකල මහතාගේ දෙවන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය නොවැ. මස 22 සිට 25 දින දක්වා කොළඹ ලයනල් වෙන්ඩ් කලාගාරයේ හැරල්ඩ් පීරිස් ශාලාවේ දී පැවැත්වුණි.







## සුවඳ පද්ම සම්මානය බන්දු ගුණරත්නයන් හට

1965 වසරේ දී කොඩැක් පෙට්ටි කැමරාවෙන් ඡායාරූප දිවියට අත්පොත් තැබූ බන්දු ගුණරත්නයන් මහතා අදවන විට ජාත්‍යන්තර සම්මාන ලාභී ප්‍රවීණ ඡායාරූප කලාවේදියෙකි. එතුමා විසින් ශ්‍රී ලාංකේය ඡායාරූප ක්ෂේත්‍රයට ඉටුකරන ලද මෙහෙවර ඇගයීමක් වශයෙන් කලා කීර්ති කලාසූරී සතිස්චන්ද්‍ර එදිරිසිංහයන් සහභාගීත්වයෙන් සිදුකරන මිහිදු සංස්කෘතික පදනම සංවිධානය කරන ලද සුවඳ පද්ම උපහාර සම්මාන උලෙළේ දී බන්දු ගුණරත්නයන් ස්වර්ණ සම්මාණයෙන් පිදුම් ලැබීය. බන්දු ගුණරත්නයන් වෙනුවෙන් සම්මානය ලබා ගැනීමට ඔහුගේ ඥාති දියණියක වන මලීෂා කුලසේකර විසින් කටයුතු කරන ලදී.

## සුනන්ද කෝදාගොඩට ප්‍රණාම අභිෂේක



සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය වශයෙන් කලාකරුවන්හට පිරිනමනු ලබන විශිෂ්ට කලාකරු උපහාර "ප්‍රණාම අභිෂේක සම්මානය" මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පසුගියදා සුනන්ද කෝදාගොඩහට පිරිනමනු ලැබීය. වසර හතලිහකට අධික කාලයක් සාහිත්‍ය ක්ෂේත්‍රයේ සහ වසර තිහකට අධික කාලයක් ඡායාරූප ක්ෂේත්‍රයේ රැඳී සිටිමින් ලේඛකයෙකු, මාධ්‍යවේදියෙකු, ඡායාරූපශිල්පියෙකු වශයෙන් කටයුතු කර ඇති සුනන්ද කෝදාගොඩ සාහිත්‍ය හා ඡායාරූප ක්ෂේත්‍රයේ සම්මාන රැසක් හිමිකර ගැනීමට සමත්වී ඇත.

# ප්‍රදර්ශන පුවත්








## ශ්‍රී ලාංකේය සුන්දරත්වය ඇමරිකාවේ විහිදෙවූ අපේ සහෘදයින්

ශ්‍රී ලංකාවේ විචිත්‍රත්වය ලොවට කියාපෑමට මෙන්ම දේශීයත්වය ප්‍රචලිත කරමින් මෙරට සංචාරක ආකර්ෂණය වැඩිකර ගැනීමට මංපෙත් විවර කරමින් ඇමරිකා - ශ්‍රී ලංකා ඡායාරූප කලා සංගමයේ සූරිය පෙරේරා මහතාගේ පූර්ණ මැදිහත්වීම මත ලාංකේය ප්‍රවීණ ඡායාරූපශිල්පීන් සයදෙනකු ගේ සේයාරූ ඇතුළත් “The Beauty Of Srilanka 2019” නමින් ඡායාරුප ප්‍රදර්ශනයක් පසුගිය සැප්තැම්බරයේ ඇමරිකා කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ දී පැවැත්විය. මේ සඳහා අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෝ මෙන්ම රෝහිත ගුණවර්ධන, කේ. ජී. කීර්තිරත්න, යමුනි රශ්මිකා, විකුම් සේනානායක, රංජනී පෙරේරා සමඟ කුමාර කරුණාරත්න යන ප්‍රවීණ ඡායාරූපශිල්පීහු සම්බන්ධ වූහ.

# ජයග්‍රහණ

## මාසික තරඟ ජයග්‍රහණ - කැලණි විහාරය (2019 සැප්තැම්බර් 08)



- ඒක වර්ණ

01. තරිඳු නවරත්න
02. සමීර කොතලාවල
03. ඒ.එල්.පී.ආර්. හර්ශන
04. සමීර කොතලාවල
05. ඉරෝශන් බණ්ඩාර

*එල්. බී. එස්. එස්. බාලසූරිය ශූරතාව*
*තරිඳු නවරත්න*



- වර්ණ

01. නදීක ප්‍රියදර්ශන
02. ප්‍රබුද්ධ කරුණානායක
03. සමීර කොතලාවල
04. තුෂාර කළුනායක
05. නුවන් වික්‍රමපාල

*ඡායාරූප තේරීම් කමිටුව :*

» *චන්ද්‍රසේන පෙරේරා මහතා*
» *කේ. ජී. කීර්තිරත්න මහතා*
» *සම්පත් පීරිස් මහතා*

*මාසික තරඟ සංවිධායක කමිටුව:*

- *මධුරංග අබේවර්ධන (0773 549 449)*
- *ශෙහාන් ප්‍රනාන්දු*
- *සුරේෂ් වීරසිංහ*
- *හේමමාලි අල්විස්*

# ප්‍රකාශන පුවත්

## ඔබත් පිළිසඳරට ලියන්න..

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට. ඔබේ තොරතුරුත් පිළිසඳරට යොමුකරන්න.

ගරු. ප්‍රකාශන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,
නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.
Email: npassrilanka@gmail.com / kmanujith@gmail.com

**පිළිසඳරට වෙහෙස මහන්සිය**

**ප්‍රකාශන අධ්‍යක්ෂ - මනුජිත් කටුගම්පොළ**

*පිළිසඳර ප්‍රකාශන අනුකමිටුව*

චමින්ද වීරසිංහ/ නදීක ප්‍රියදර්ශන/ මධුෂිකා ලක්මාලි
මධූෂා සෙනෙවිරත්න/ දර්ශන ප්‍රභාත්

